**පොලිස් ත්‍යාග අරමුදල - 2023**
**----------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

පොලිස් ත්‍යාග අරමුදලේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය , ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අරමුදල ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදල අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතු ය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු ය. කෙසේ වුව ද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන්වීමට හැකි ය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂයය පථය ද පුළුල්කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අරමුදලේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අරමුදල ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව, සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2023 දෙසැම්බර් මස බැංකු සැසඳුම් ප්‍රකාශයෙහි හඳුනා නොගත් ලැබීම් ලෙස දක්වා තිබුණු රු.18,600,000 ක් භෝජනාගාර හා තනිකඩ භට නිවාස ඉදිකිරීම සඳහා විශේෂ කාර්ය බලකායට ලබාදී තිබූ අග්‍රිම මුදලක් වන අතර, වර්ෂය අවසානයේ එම මුදල් වියදම් කිරීමකින් තොරව ආපසු එවා තිබුණ ද, එය නිවැරදිව හඳුනාගෙන ගිණුම්වලට ගැලපීම් නොකිරීම හේතුවෙන් ආදායම් ප්‍රකාශයේ භෝජනාගාර හා බැරැක්ක ඉදිකිරීමේ වියදම රු.18,600,000 ක් වැඩියෙන් ද, වර්ෂයේ අතිරික්තය එම ප්‍රමාණයෙන් අඩුවෙන් ද දක්වා තිබුණි. එමෙන්ම වැය නොවූ මෙම මුදල මුදල් ශේෂයට නොගැලපීම හේතුවෙන් ජංගම වත්කම් එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | මුදල් ආපසු එවීම ගැලපුම් කිරීම අතපසුවීමකින් මඟ හැරී ඇත. 2024 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී මෙම වරද නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වා තිබුණි. | වර්ෂයට අදාළ වියදම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතු ය. |
| (ආ) අපරාධ යුක්තිය පිළිබඳ පූර්ණ කාලීන උපාධි පාඨමාලාව හැදෑරීම සඳහා අරමුදලින් පොලිස් නිලධාරියෙක් සඳහා ගෙවා තිබූ රු.550,000 ක මුදල, එම නිලධාරියා පාඨමාලාවෙන් ඉවත් වීම මත නැවත අය කිරීම 2023 ඔක්තෝබර් 23 දින අනුමත කර තිබුණ ද, එම වටිනාකම අරමුදලට ලැබිය යුතු මුදලක් ලෙස හඳුනාගෙන ගිණුම්ගත නොකිරීම හේතුවෙන් ආදායම් ප්‍රකාශනයේ සුභසාධන වියදම හා මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ජංගම වත්කම් පිළිවෙලින් එම වටිනාකමින් වැඩියෙන් හා අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | ජාතික පොලිස් අභ්‍යාස ආයතනය මඟින් අයවිය යුතු රු. 550,000 ක මුදල ආපසු ලබාගැනීමට කටයුතු කරන අතර, 2024 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී මෙම වරද නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වා තිබුණි. | වර්ෂයට අදාළ ලැබිය යුතු ආදායම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතු ය. |

| | | |
|---|---|---|
| (ඇ) සමාලෝචිත වර්ෂයේ උසාවි දඩ මුදල් ආදායම හා වර්ෂය අවසානයේ ලැබිය යුතු උසාවි දඩ මුදල් ආදායම ගිණුම්ගත කිරීමේදී උසාවි 04 කට අදාළව දඩ මුදල් ආදායම රු.8,912,551 ක් වැඩියෙන් ද, තවත් උසාවි 06 කින් රු.10,511,268 ක් අඩුවෙන් ද ගිණුම්ගත කර තිබුණි. මේ හේතුවෙන් ආදායම් ප්‍රකාශනයේ උසාවි දඩ මුදල් ආදායම සහ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ලැබිය යුතු උසාවි දඩ මුදල් ආදායම රු. 1,598,717 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | කොට්ඨාශ කාර්යාල මඟින් වාර්තා කළ දඩ මුදල් වටිනාකම හා අධිකරණ මඟින් ත්‍යාග අරමුදලට එවන ලද චෙක්පත් වටිනාකම අතර වෙනස්කම් පැවතීම නිසා මෙම දෝෂ හටගෙන ඇති බවත් උසාවි දඩ මුදල් ගිණුම්ගත කිරීමේ දී සිදු වී ඇති වැඩියෙන් ගිණුම්ගත කිරීම හා අඩුවෙන් ගිණුම්ගත කිරීම 2024 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මඟින් නිවැරදි කරන බවත්, පොතුවිල් හා හිඟුරක්ගොඩ උසාවි දෙකෙහි කොට්ඨාශ වාර්තා පදනම්ව පිළියෙල කර ඇති බැවින් මූල්‍ය ප්‍රකාශනයේ දක්වා ඇති වටිනාකම් නිවැරදි බවත් දන්වා තිබුණි. | වර්ෂයට අදාළ නිවැරදි උසාවි දඩ මුදල් ආදායම හඳුනාගෙන ගිණුම්ගත කළ යුතු ය. |
| (ඈ) මූල්‍ය තත්ත්ව ප්‍රකාශය සමඟ ඉදිරිපත් කර ඇති උපලේඛන 05 හි සඳහන් ගෙවිය යුතු විශේෂ ත්‍යාග වටිනාකමට ඇතුළත් වී ඇති ගොනු 5 කට අදාළව නඩු කටයුතු අවසන් කර ඇති නමුත්, සැකකරුවන් නිදහස් කිරීම, මියයාම, නඩු බහා තැබීම වැනි හේතු මත ගෙවීමට නොහැකි ඉතිරි අඩ වටිනාකම වූ රු.5,567,500 ක් මූල්‍ය තත්ත්ව ප්‍රකාශයෙහි ගෙවිය යුතු විශේෂ ත්‍යාග වටිනාකම තුළ සාවද්‍ය ලෙස ඇතුළත් කර තිබුණු අතර, මෙම වටිනාකම මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ගෙවිය යුතු විශේෂ ත්‍යාග වියදමට හා සමුච්චිත අරමුදලට ගළපා නොතිබුණි. | 2024 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී මෙම වරද නිවැරදි කිරීමට කටයුතු කරන බව දැනුම්දී තිබුණි. | ගෙවිය යුතු විශේෂ ත්‍යාග වටිනාකම් තුළ ඇතුළත් වටිනාකම්වල නිවැරදිතාවය තහවුරු කරගෙන අවශ්‍ය ගැළපීම් කළ යුතු ය. |
| (ඉ) ස්ථානීය දඩ මුදල් ආදායම හඳුනාගැනීමේදී දිස්ත්‍රික් ලේකම් කාර්යාල 03 ක ආදායම් මුදල් පදනමට ගිණුම්ගත කිරීම නිසා වර්ෂය ආරම්භයේ ලැබිය යුතු රු.5,121,700 ක් වර්ෂයේ ආදායම ලෙස ගිණුම්ගත කර තිබූ අතර, වර්ෂය අවසානයේ ලැබිය යුතු රු.5,751,380 ක් ගිණුම්ගත කර නොතිබුණි. මේ නිසා වර්ෂයේ ස්ථානීය දඩ මුදල් ආදායමේ ශුද්ධ වටිනාකම රු.629,680 ක් අඩුවෙන් නිරූපණය විය. | 2024 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී මෙම වරද නිවැරදි කිරීමට කටයුතු කරන බව දැනුම්දී තිබුණි. | වර්ෂයට අදාළ නිවැරදි ස්ථානීය දඩ මුදල් ආදායම හඳුනාගෙන ගිණුම්ගත කළ යුතු ය. |

**1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්**

**1.6.1 ගෙවිය යුතු මුදල්**

| **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| සියයට 50 ක් ගෙවා තිබූ විශේෂ ත්‍යාග ගොනුවකට අදාළව 2011 වර්ෂය වන විට සැකකරුවන් වැරදිකරු කර නඩු කටයුතු අවසන්කර ඇතත්, ත්‍යාග මුදලේ ඉතිරි අඩ වන රු.625,000 ක මුදල ගෙවා නිරවුල් කර නොතිබුණි. | අධ්‍යක්ෂ, අපරාධ බුද්ධි විශ්ලේෂණ හා නිවාරණ කොට්ඨාශය මඟින් අදාළ ගොනු ගෙන්වාගෙන ඉදිරියේදී ගෙවීම් කටයුතු කිරීමට කටයුතු කරන බව දැනුම්දී තිබුණි. | ගෙවිය යුතු විශේෂ ත්‍යාග වටිනාකම් තුළ ඇතුළත් වටිනාකම්වල නිවැරදිතාවය තහවුරු කරගෙන අවශ්‍ය ගැළපීම් කළ යුතු ය. |

**1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| **නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව** | **අනුකූල නොවීම** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (අ) 2023 අප්‍රේල් 26 දින පැවති රජයේ ගිණුම් පිළිබඳ කාරක සභා රැස්වීමේ කාර්ය සටහනේ අංක 11 යටතේ වූ නියෝගය | 1990.03.09 දිනැති අතිවිශේෂ ගැසට්පත්‍රය මඟින් ප්‍රකාශිත නියෝග අනුව පොලිස් ත්‍යාග අරමුදලින් ගෙවීම් සිදුවන බැවින් එම නියෝග නිසි ක්‍රමවේදයකට අනුව වර්තමානයට ගැළපෙන ලෙස යාවත්කාලීන කිරීමට කටයුතු කරන ලෙසත්, රථවාහන පොලිස් නිලධාරීන් සඳහා ලබාදෙන ත්‍යාග මුදල් ප්‍රමාණය වැඩි කරන ලෙසත් නියෝග කර තිබුණද ඊට අනුකූලව කටයුතු කර නොතිබුණි. | අදාළ නියෝග නිසි ක්‍රමවේදයකට අනුව වර්තමානයට ගැළපෙන ලෙස යාවත්කාලීන කිරීමට කටයුතු කරන බව දැනුම්දී තිබුණි. | රජයේ ගිණුම් කාරක සභාවේ නියෝගය අනුව කටයුතු කළ යුතු ය. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 396 | 2023 දෙසැම්බර් 31 දිනට නිකුත් කළ නමුත් ගෙවීමට ඉදිරිපත් නොවූ මාස 06 ඉක්මවා ඇති රු. 372,500 ක් වටිනා චෙක්පත් 43 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 396 (ඇ) ප්‍රකාර කටයුතු කර නොතිබුණි. | අදාළ චෙක්පත් 43 සම්බන්ධයෙන් මාගේ FD09/05/2023 සමාංක හා 2024.04.04 දිනැති ලිපිය මඟින් අධ්‍යක්ෂක , අපරාධ බුද්ධි විශ්ලේෂණ හා නිවාරණ කොට්ඨාශය වෙත ඉදිරි ක්‍රියාමාර්ග ගන්නා ලෙස දැනුම්දී ඇති අතර, එම චෙක්පත් ගෙවීම් සඳහා ඉදිරිපත් නොවන්නේ නම් ඉදිරියේදී ආදායමට ගැනීමට කටයුතු කරන බව දැනුම්දී තිබුණි. | මුදල් රෙගුලාසි 396 (ඇ) ප්‍රකාර කටයුතු කළ යුතු ය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය විසින් 2014 පෙබරවාරි 17 වන දින රාජ්‍ය ආයතනවල සංයුක්ත සැලැස්ම හා වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සම්බන්ධයෙන් නිකුත් කරන ලද PED/RED/01/04 /2014/01 අංක දරන චක්‍රලේඛයේ 04 ඡේදය. | අදාළ පනතේ සඳහන් අරමුණු සාක්ෂාත් කර ගැනීම ඉලක්ක කරගත් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් සකස්කර නොතිබුණි. | කාර්තුමය වශයෙන් ක්‍රියාකාරී සැලසුම් සකස් කර ඇති අතර, කාර්තුමය ප්‍රගතිය මහජන ආරක්ෂක අමාත්‍යාංශය, ජාතික අයවැය අධ්‍යක්ෂ ජනරාල්, රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්, විගණකාධිපති වෙත වාර්තාකර ඇති බව දැනුම්දී තිබුණි. | යොමුගත චක්‍රලේඛය ප්‍රකාරව වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කළ යුතු ය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.4,828,432,640 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.2,419,131,941 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.2,409,300,699 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට ස්ථාවර තැන්පතු පොළී ආදායම රු.2,321,069,311 ක් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) රථවාහන දිසාව භාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිගේ රථවාහන උපදෙස් චක්‍රලේඛ අංක 149 /2019 අනුව එක් බීමත් රියදුරෙක් (පොදු මගී ප්‍රවාහනය නොවන) අත්අඩංගුවට ගැනීම සිදු කළ නිලධාරීන්ට රු.2,500 ක ත්‍යාග මුදලක් ගෙවිය හැකි වුව ද, නියැදි පරීක්ෂාවට අනුව පොලිස් ස්ථාන 18 ක් විසින් බීමත් රියදුරන් 5,449 ක් අත්අඩංගුවට ගෙන තිබුණ ද, අදාළ | පොලිස් ස්ථාන 18 ක් විසින් බීමත් රියදුරන් 5449 ක් අත්අඩංගුවට ගෙන තිබීම සම්බන්ධයෙන් විමසීමේදී පොලිස් ස්ථාන 13 කට අදාළව පිළිතුරු එවා නොමැති අතර, සෙසු පොලිස් ස්ථානවල ද වවුචර් ඉදිරිපත් කර නොතිබූ බවත්, ඉදිරියේදී මෙවැනි අතපසුවීම් නොවීමට කටයුතු සිදු කරන බවත් දැනුම්දී තිබුණි. | අදාළ වර්ෂය තුළ ම ගෙවීමට කටයුතු කළ යුතු ය. |

| | | | |
|---|---|---|---|
| | නිලධාරීන්ට 2023 වර්ෂය තුළදී කිසිදු ත්‍යාග මුදලක් ගෙවා නොතිබුණි. | | |
| (ආ) | නියැදි පරීක්ෂාවට ලක් වූ රාජකාරියේ යෙදී සිටියදී මියගිය පොලිස් නිලධාරීන් සඳහා පසුගිය වසර 04 ක පමණ කාලය තුළ රු.මිලියන 1 සිට 5 දක්වා පරාසයක ත්‍යාග ගෙවීම් පැවතිය ද,<br>මේ සඳහා පොදුවේ හඳුනාගත් නිර්නායක පදනම්කර ගැනීමක් හෝ පොදුවේ නිකුත් කළ උපදෙස් මාලාවක් හෝ නොතිබුණි. | රාජකාරියේ යෙදී සිටියදී මියගිය පොලිස් නිලධාරීන් වෙනුවෙන් ඔවුන්ගේ යැපෙන්නන්ට ත්‍යාග මුදල් ගෙවීම සඳහා නිර්ණායක ඇතුළත් පොදු උපදෙස් මාලාවක් නිකුත් කිරීමට කටයුතු කරන බව දැනුම්දී තිබුණි. | පොදු උපදෙස් මාලාවක් හඳුන්වාදී ඒ අනුව කටයුතු කළ යුතු ය. |
| (ඇ) | වසර 03 හා 04 බැගින් වූ පූර්ණ කාලීන උපාධි පාඨමාලා හැදෑරීම සඳහා ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලය වෙත 2022 ජනවාරි 19 දින හා 2023 ජනවාරි 23 දින ආරම්භ වූ උපාධි පාඨමාලා 05 ක් සඳහා නිලධාරීන් 122 ක් අනුයුක්ත කර තිබුණ ද,<br>පූර්ව සැලසුම් කිරීමකින් තොරව හා ප්‍රමාණවත් ප්‍රතිපාදන නොතිබියදී ආරම්භකර ඇති මෙම ව්‍යාපෘති සඳහා ත්‍යාග අරමුදලින් 2023 අගෝස්තු 17 දින රු.60,550,000 ක් උපාධි පාඨමාලා ගාස්තු ලෙස පොලිස්පතිගේ අනුමැතිය මත පොලිස් ත්‍යාග අරමුදලින් ගෙවා තිබුණි. | පොලිස් නිලධාරීන්ගේ කුසලතා හා ධාරිතා වර්ධනය කිරීම මඟින් මහජනතාවට උසස් සේවාවක් ලබාදීම අරමුණු කරගෙන උපාධි පාඨමාලා සඳහා ගාස්තු ගෙවීම සිදු කර ඇති බව දන්වා තිබුණි. | පූර්ව සැලසුම් කිරීම හා අනුමැතිය මත වියදම් දැරීමට කටයුතු කළ යුතු ය. |
| (ඈ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් මාසය සඳහා පිළියෙල කර තිබූ බැංකු සැසඳුම් ප්‍රකාශනය අනුව හඳුනානොගත් ලැබීම් වටිනාකම තුළ 2022 දෙසැම්බර් 30 දින බැර වූ රු. 544,400 ක් ද, 2023 ජනවාරි 12 දින බැර වූ රු.570,180 ක් ද වූ අතර, මෙම හඳුනානොගත් ලැබීම් සඳහා වසරක පමණ කාලයක් ගතවී තිබුණ ද හඳුනාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි. | 2023.12.21 දිනට තැන්පත් කළ නමුත්, හඳුනා නොගත් සෘජු තැන්පතු ලෙස එම චෙක්පත් මුදල් පොතට ගෙන නිවැරදි කර ඇති බව දන්වා තිබුණි. | කාල පමාවකින් තොරව හඳුනා නොගත් බැංකු ශේෂ හඳුනාගෙන ගිණුම් තැබීමට කටයුතු කළ යුතු ය. |

## 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කළුතර පොලිස් කොට්ඨාශයේ 2023 වර්ෂය අවසානයේදී ත්‍යාග අයදුම් කිරීමෙන් පසු ගෙවිය යුතු වවුචර් සංඛ්‍යාව 4,885 ක් වූ අතර, එම වවුචර් මාස 03 සිට 12 දක්වා ප්‍රමාදයක් වූ අතර පොලිස් ස්ථානාධිපති වරුන්ගේ හා කොට්ඨාශ භාර නිලධාරීගේ ත්‍යාග මුදල් ගෙවීම පිළිබඳ පවතින ඍජු අධීක්ෂණය ප්‍රමාණවත් නොවීම මෙම තත්ත්වයට හේතුවී ඇති බව නිරීක්ෂණය විය. | කළුතර පොලිස් කොට්ඨාශයේ 2023 වර්ෂයේ නොගෙවන ලද වවුචර්පත් සංඛ්‍යාව 4,885 ක් වූ අතර, දැනටමත් ගෙවූ වවුචර්පත් සංඛ්‍යාව 3776 කි. ඒ අනුව ගෙවීමට ඇති ඉතිරි වවුචර්පත් 1,509 සඳහා ඉදිරියේදී ගෙවීම් කිරීමට කටයුතු කරන බව දන්වා තිබුණි. | අදාළ වර්ෂය තුළදී ම ගෙවීම් කිරීමට කටයුතු කළ යුතු ය. |
| (ආ) | උසාවි මගින් පොලිස් ත්‍යාග අරමුදලට මුදල් එවීමේදී 2023 දෙසැම්බර් 31 දිනට මාස 03 සිට මාස 07 ක් දක්වා ප්‍රමාදයන් සහිතව උසාවි 05 ක් විසින් ලබාදිය යුතු මුදල රු.12,026,458 ක් විය. මේ අනුව දීර්ඝ කාලපමාවක් සහිතව තැගි අරමුදලට ආදායම් රැස්කිරීම තුළින්, මුදල් රෙගුලාසි 128 (2)(ඉ) හා (ඊ) අනුව කටයුතු කර නොමැති බව නිරීක්ෂණය විය. | 2023.12.31 ලැබිය යුතු හිඟ මුදලින් රු. 9,826,596 ක් මේ වන විට ලැබී ඇත. යාපනය මහේස්ත්‍රාත් අධිකරණය මඟින් ලැබිය යුතු රු. 2,199,862 ක මුදල ගෙන්වා ගැනීමට කටයුතු කරන බව දන්වා තිබුණි. | අදාළ වර්ෂය තුළදී ම ආදායම් රැස්කිරීමට කටයුතු කළ යුතු ය. |

## 4 ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

## 4.1 අයවැය පාලනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සංශෝධිත අයවැය සමඟ තථ්‍ය අගයයන් සැසඳීමේදී මුළු ආදායම සියයට 78 කින් වර්ධනය වී තිබූ නමුත්, මුළු වියදම සියයට 21 කින් පහත වැටී තිබීම මත අතිරික්තය සියයට 339 කින් වර්ධනය වී තිබුණි. සමාලෝචිත වර්ෂයේ විශේෂ ත්‍යාග වියදම් වටිනාකම ඇස්තමේන්තුගත මුදලට වඩා සියයට 82 ක් අඩුවීම ද, රථවාහන ත්‍යාග වියදම් වටිනාකම ඇස්තමේන්තු ගත වියදමට වඩා සියයට 29 කින් අඩුවීම හා විනෝද ත්‍යාග අග්‍රිම වියදම ඇස්තමේන්තුගත වියදමට වඩා සියයට 51 කින් අඩුවීම ද සිදුව තිබුණි. 2023 වර්ෂයේ දෙසැම්බර් මස අයවැය සංශෝධනය කර තිබියදීත් මෙවැනි විචලනයන් පැවතීම තුළින් අයවැය පිළියෙල කිරීමේදී හා අරමුදල් කළමනාකරණයේදී ප්‍රමාණවත් අවධානයක් යොමුකර නොතිබූ බව නිරීක්ෂණය විය. | අයවැය හා තථ්‍ය අගයන් අතර විචලනය අවම වන පරිදි ඇස්තමේන්තු සකස් කිරීමට කටයුතු කරන බව දන්වා තිබුණි. | අයවැය පිළියෙල කිරීමේදී වඩාත් තාත්විකව පිළියෙල කිරීම හා අයවැයට අනුරූපව කටයුතු කළ යුතු ය. |